# 1.22 දකුණු ගුරුකුලයේ විහාර චිත්‍ර ශිල්පීන් ; සමාජසංස්කෘතික පසුබිම සහ නිර්මාණ ක්‍රියාවලිය

ජේ.ඒ. වජිර නලින්ද ජයතිලක
දෘශ්‍ය කලා සැලසුම්කරණ හා ප්‍රාසංගික කලා ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

## ABSTRACT

ශ්‍රී ලංකාවේ පහතරට වෙරළබඩ තීරයේ ව්‍යාප්තව පැවති දකුණු ගුරුකුලයේ චිත්‍ර ශිල්පීන්ගේ සමාජ-සංස්කෘතික පසුබිම සහ නිර්මාණ ක්‍රියාවලිය උඩරට ප්‍රදේශයේ පැතිර තිබූ මධ්‍යම මහනුවර ගුරුකුලයේ චිත්‍ර ශිල්පීන්ගේ එකී ලක්‍ෂණ සමග සැසඳීමේ දී වෙනස්කම් ගණනාවක් හඳුනාගත හැකිය. උඩරට සිත්තරුන් සඳහා වූ සම්මතව පැවති කුලක්‍රමය පහත රට දී ඒ අයුරින්ම අනුගමනය නොකිරීම ඉන් එකකි. උඩරට සිත්තරුන් නවන්දන්න කුලයට සීමා වුවද දකුණු ගුරුකුලයේ දී එම කුලයට අමතරව දුරාව, කරාව, නැකති වැනි කුලවල ශිල්පීන්ට ද සිතුවම්කරණයේ නියැලීමට අවස්ථාව ලැබුණි. කැලණි විහාරයේ සිතුවම් ඇඳි දෙවුන්දර අන්දිරිස් දුරාව කුලයට අයත් ශිල්පියෙකි. උඩරට දී මෙන් සිත්තරුන්ට පැනවුණු දැඩි ශිල්ප ධර්ම පුහුණු සම්ප්‍රදායක් පහතරට දී ක්‍රියාත්මක නොවීම තවත් වැදගත් කරුණකි. මේ නිසා සාම්ප්‍රදායික සම්මත මෝස්තර රටා වෙනුවට දකුණු ගුරුකුලයේ සිතුවම්වලට සුලභ ව ශිල්පීන්ගේ ස්වාධීන අදහස් සහ සංකල්ප සහ බටහිර කලා ලක්‍ෂණ එක් වී ඇත. කතළුව පූර්වාරාමයේ මකර තොරණට මිදිවැල් සහ රෝසමල් මෝස්තර එක්කිරීම මෙයට එක් නිදසුනකි. මෙම නිදහස නිසා දකුණු ගුරුකුලයේ සිතුවම් විවිධත්වයෙන් යුතු අතර එහි උප ශෛලීන් පහක් පමණ හඳුනාගත හැකි ය. පහතරට දී සිතුවම් නිර්මාණය ක්‍රමයෙන් කොන්ත්‍රාත් ක්‍රමය මත පදනම් වූ ක්‍රියාවලියක් බවට පරිවර්තනයවීම තවත් වැදගත් කරුණකි. වෙහෙරගල්ල සමුද්‍රගිරි විහාරයේ සිත්තරුන්ට කළ එබඳු ගෙවීමක් පිළිබඳ ලේඛනයක් ඇත. පන්සල් චිත්‍ර ඇඳීමට අමතරව දකුණු ගුරුකුලයේ සිත්තරුන් නාට්‍ය පසුබිම් දර්ශන නිර්මාණය, ක්‍රීඩාගාර ලාංඡන ඇඳීම වැනි කටයුතුවල ද නියැලිණු බවට සාධක හමු වේ. දකුණු ගුරුකුලයේ ශිල්පීන් බහුතරයක් ආර්ථික වශයෙන් අස්ථාවර තත්ත්වයක පසුවීම කැපී පෙනෙන ලක්‍ෂණයකි. මධ්‍යම මහනුවර ගුරුකුලයේ සිත්තරුන්ට මෙන් සන්නස්, සිට්ටු, තුඩපත් ආදියෙන් කළ දීමනා හා ප්‍රදාන දකුණු ගුරුකුලයේ ශිල්පීන් ලද බවට සාධක නොමැත. සිත්තරුන්ගේ දුක්ඛිත තත්ත්වය සහ ඔවුන්ට ගෙවීම් කිරීමට තිබූ අපහසුව පිළිබඳව අනුග්‍රාහකයින්ට ලියූ ලිපි මිහිරිපැන්නේ ධම්මරතන වැනි සමකාලීන කිවිවරුන්ගේ කාව්‍යයන් අතර හමු වේ ශිල්පීය නාමවලින් පෙනෙන පරිදි දකුණු ශිල්පීන් දීර්ඝ කාලයක් බටහිර යටත් විජිත පාලනයට හසුව තිබූ ගාල්ල, දෙවුන්දර, මිරිස්ස, මාතර වැනි ප්‍රදේශවලින් බිහි වූ පිරිස්ය. මේ නිසා බටහිර ලක්‍ෂණ සුලභව පහතරට චිත්‍රවල අන්තර්ගත ව ඇත. තවද දකුණු ගුරුකුලයේ සිත්තරුන් පුවත්පත්, ඡායාරූප, විදේශිය සිත්තරුන්ගේ සිතුවම්, රූප සටහන් සහිත මුද්‍රිත පොත්පත් බඳු නව මාධ්‍යයන්ගේ බලපෑම කරණකොටගෙන බිහි වූ සංස්කෘතික පරිවර්තන ධාරාවට ද හසුවූවන් බව ඔවුන්ගේ සිතුවම් පිරික්සීමේ දී පෙනේ.